**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ග්‍රෙගරී පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp


## පුවත්පත් නිවේදනය

පෙබරවාරි 20, 2013

# නැවත පදිංචි වූ ප්‍රජාවගේ ජීවනෝපායන් නගා සිටුවීම සඳහා ජපන් රාජ්‍ය නොවන සංවිධාන හරහා මිලියන 80ක ආධාරක්

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැවත පදිංචිවූ ප්‍රජාවගේ ජීවනෝපායන් නගා සිටුවීමට උතුරු නැගෙනහිර පළාත් වල 2009 පටන් නැවත ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු වල නිරතව සිටින පීස් වින්ඩ්ස් ජපන් (Peace Winds Japan - PWJ) නම් වූ ජපන් රාජ්‍ය නොවන සංවිධානය හරහා ජපන් රජය විසින් ඇමරිකානු ඩොලර් 636,874 (දළ වශයෙන් රුපියල් මිලියන 80) ක් පරිත්‍යාග කරන ලදි

අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වූ මෙම වැඩසටහනෙහි මෙය තෙවන අදියර වන අතර ඒ තුලින් කෘෂිකර්මය සහ කිරි නිෂ්පාදනය තුලින් ජීවනෝපයන් නගා සිටුවීමට බලාපොරොත්තුවේ මෙම වැඩ සටහනේ මුල් අදියර දෙකෙහිදී කුඩා වැව් 14ක් පුනරුත්තාපනය කර ගොවි සංවිධාන සහ පශු සම්පත් සුභසාධන සංගම් හරහා අදාල පුහුණු සහ උපකරණ ලබාදීමද සිදුකරන ලදී මෙම මුළු ව්‍යාපෘතිය හරහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවුල් 2000 කට වඩා වැඩි පිරිසක් ප්‍රතිලාභ ලබනු ඇත

ලෝක සාමය සහ සංවර්ධනය උදෙසා මෙන්ම ශ්‍රී ලංකාවේද උතුරු සහ නැගෙනහිර නැවත පදිංචි වුවන්ගේ ජීවන තත්වයන් නගා සිටුවීම මධ්‍යම කාලීන සහ දීර්ඝ කාලීන සංවර්ධනයත් විශේෂයෙන් සුහසාධන කටයුතුත් හරහා තිරසාර සාමය ක් උදාකිරීමට ජපන් රජය විසින් මහත් කැප කිරීමක් කරනු ලැබේ.

ජපන් රාජ්‍ය නොවන සංවිධානයේ තනිගුචි මහත්මිය පැවසුයේ නිරතුරු පසුවිපරම් තුලින් ගොවි සංවිධාන සහ පශු සම්පත් සුහසාධන සංගම් වල හැකියාවන් සහ ශක්තීන් වර්ධනය කිරීමට මෙම අදියර හරහා බලාපොරොත්තු වන බවය මෙම අදියර තුලදීද කුඩා වැව් 8ක් ප්‍රතිසංස්කරණය කර කිරි ගෙවීන් ද ශක්තිමත් කර ඔවුනගේ ජීවන මාර්ග තැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වන බවද ඇය වැඩි දුරටත් පැවසීය. අවතැන් වු ප්‍රජාව ඔවුන්ගේ ජීවිත නැවත නගා සිටුවීමට සමත් වෙහෙසක් ගන්නා බැවින් මෙම ආයතනයේ අරමුණ එම ප්‍රජවට අත්වැලක් වීමට බවද ඇය පැවසීය.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත්, පීස් වින්ඩ්ස් ජපන් (Peace Winds Japan - PWJ) නම් වු ජපන් රාජ්‍ය නොවන සංවිධානයේ නේවාසික නියෝජිත කනා තනිගුචි මහත්මියත් අතර, 2013 පෙබරවාරි 20 වන දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලදී.

*        *        *

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න
ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය
දුරකථන 011-2693831 දිගු අංකය 225
ඊ මේල් : cultujpn@co.mofa.go.jp